# 16 දේව ප්‍රේමය

ප්‍රේම කරන්න

- දෙවියන් වහන්සේට
  - සියලු ම දේට වඩා මුළුමනින් ම
- අසල්වැසියන්ට
  - තමාට මෙන්

පළමු පනත් තුන




අනෙකුත් පනත් හත




## පළමු වන පනත

> මා හැර අන් කිසි ම දෙවි කෙනකු නුඹට නොසිටිය යුතු ය.
>
> නික්මයාම 20:3-6

> “නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ සමිඳාණන් වහන්සේට ........... ප්‍රේම කරන්න”
>
> (ලූක් 10:27)

පළමු පනත විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය මත පදනම් වන්නේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## විශ්වාසය

අපගේ විශ්වාසයේ මූලාශ්‍රය වන්නේ, ප්‍රේමයෙන් අපට අනාවරණය කරන දෙවියන් වහන්සේ ය. දෙවියන් වහන්සේ ව නොදන්නාකම සෑම පාපයකට ම හේතු වන්නේ ය (රෝම 1:18-32). මිනිසාගේ මූලික වගකීම වන්නේ, දෙවියන් වහන්සේ ව විශ්වාස කිරීමත් ඒ විශ්වාසයට නිර්භීත ව සාක්ෂි දැරීමත් ය.

පාසල් ඉගෙනුම නිම කර සමාජයට පිවිසුණු පසු ව ද ලෞකික දැනුමට සමාන්තර ව විශ්වාසය වැඩි දියුණු කර ගත යුතු ය. දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් විශ්වාසයට අනුකූල නම්, එය ඉමහත් වරප්‍රසාදයකි. විශ්වාසය පෝෂණය කරගෙන වර්ධනය කර ගැනීමට පළමු පනත අපට ආරාධනා කරයි.

එඬේරික ජීවිතයක් ගත කළත් ආබ්‍රහම් තුමා විශ්වාසයේ පියා යන විරුදාවලිය ලැබීමට තරම් ආශිර්වාදයක් ලබා ගත්තේ ය.

අභියෝගාත්මක ජීවිතයකට මුහුණ දුන් මරිය තුමියගේ විශ්වාසය ද අපට ආදර්ශයකි.

ශුද්ධ ලියවිල්ල තුළ අනාවරණය කරන සෑම දෙයක් ම එක සේ අවබෝධ කර ගැනීමට අපට නොහැකි ය. ඒ පිළිබඳ ව පුදුමයට පත් නොවන්න. වැඩිහිටියකුගේ බුද්ධිමත් භාවය ළමයකුගේ බුද්ධිමත් භාවයට වඩා වැඩි වන්නාක් මෙන් දිව්‍ය ප්‍රඥාවන්තකම, මනුෂ්‍ය ප්‍රඥාවන්තකම අසීමිත ලෙස ඉක්මවා යයි. ස්වර්ග රාජ්‍ය සඳහා දිනපතා කරන සටනේ දී මනුෂ්‍යාගේ අල්පමාත්‍ර වූ දැනීම හා ශක්තිය කෙරෙහි පමණක් විශ්වාසය තැබීම අනුවණ කමකි.

සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරන බැවින්;

1. අපි ඔවුන් වහන්සේට නමස්කාර කරමු
2. අපි ඔවුන් වහන්සේට යාච්ඤා කරමු
3. අපි ඔවුන් වහන්සේට යාග පුද කරමු
4. අපි ඔවුන් වහන්සේට බාරහාර වෙමු; පොරොන්දු දෙමු.

## 1. නමස්කාරය

දෙවියන් වහන්සේට නමස්කාර කිරීම යනු ඔවුන් වහන්සේ ව අපගේ දෙවියන් වහන්සේ, මැවුම්කරුවාණන්, ගැලවුම්කරුවාණන්, මෙලොව ඇති සියල්ලෙහි ම ස්වාමියාණන්, පාලකයාණන් හා අසීමිත කරුණා වන්ත ප්‍රේමය වන බව පිළිගැනීම ය. "ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් ගරුබිය පෑ යුතු ය. ඔවුන් වහන්සේට පමණක් වැඳුම්පිදුම් කළ යුතු ය" යනුවෙන් ශුද්ධ ලියවිල්ලේ ද්විතීය නීති සංග්‍රහයේ 6:13හි සඳහන් වන්නේ ඒ නිසා ය. දෙවියන් වහන්සේගෙන් තොර පැවැත්මක් මිනිසාට නොමැති බව පිළිගෙන, නියත වශයෙන් කරන ගෞරවය දෙවියන් වහන්සේට නමස්කාර කිරීම වන්නේ ය. එක ම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීම පාපි ඇල්මෙන් ජීවත් වන මිනිසා ව එයින් නිදහස් කිරීමකට යොමු කරවන්නේ ය.

කතෝලික සභා ධර්මෝපදේශය 2096-2097

## 2. යාච්ඤාව



16.1 රූපය - යැදුම තුළින් මුළුමනින් ම දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ වීම

විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය පළමු පනත හා අත්වැල් බැඳගෙන යාච්ඤාව තුළ සම්පූර්ණත්වයට පත් වන්නේ ය. යාච්ඤාවේ දී වන්දනාව, ප්‍රශංසාව, ස්තුති කිරීම, මැදිහත් වීමේ යැදුම් හා ඉල්ලීම් මගින් අප හදවත (මනස) දෙවියන් වහන්සේ වෙත ඔසවනු ලබයි. අපි සැමවිට අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කරමු. (ලූක් 18:1)

කතෝලික සභා ධර්මෝපදේශය 2098



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එවිට මරිය තුමී මෙසේ උදම් ඇනුවා ය; 'මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයිඃ මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදම් අනයිඃ මක්නිසා ද එතුමාණෝ සිය දසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක. හැම පරපුරක් ම මෙතැන් සිට, භාග්‍යවන්තී ය'යි මට කියනු ඇත.

(ලූක් 1:46-48)

මරි මවුන් මෙන් සැම අභියෝගයක දී ම  දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට අපට හැකි නම්, දේව ප්‍රේමය අසීමිත ව අත්දැකීමට අපට හැකි ය.

## 3. යාග වීම



16.2 රූපය - මිනිසා පාපයෙන් ගලවා ගැනීමට   ජේසුස් වහන්සේ යාග වීම

යාග ඔප්පු කිරීම දේව වන්දනාවේ හා ස්තුතියේ සලකුණකි. එහෙත් බාහිර ලෙස සිදු කරන යාගය අවංක එකක් වීමට නම් එමගින් අපගේ ආධ්‍යාත්මික යාගයේ ප්‍රකාශ වීමක් විය යුතු ය. දෙවියන් වහන්සේට ප්‍රිය පඬුර නම් බිඳුණු හදවතකි. සහෝදර ප්‍රේමය හා බද්ධ නොවූ පඬුරු දිවැසිවරු ප්‍රතික්ෂේප කළහ. ජේසුස් වහන්සේ ද හොසියා උපුටා දක්වමින් මෙසේ කියයි: "මම පූජාවලට වඩා කරුණාවට කැමැත්තෙමි; දවන යාග පූජාවලට වඩා දෙවියන් වහන්සේ පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි (හොසියා 6:6). එක ම සම්පූර්ණ යාගය වන්නේ, ක්‍රිස්තුස් වහන්සේ කුරුසිය මත පුදන ලද යාගය යි. අපගේ ජීවිත, එම යාගය හා ඒකාබද්ධ කිරීමෙන්, අපගේ ජීවිත, යාග කොට දෙවියන් වහන්සේට ඔප්පු කළ හැකි ය.

කතෝලික සභා ධර්මෝපදේශය 2099-2100

## 4. පොරොන්දු හා බාරහාර

අපගේ භක්තියේ කොටසක් ලෙස අපි එදිනෙදා කරන යාච්ඤාවලට අමතර ව යාච්ඤාවක් කීමට, ඉටි පහන් දල් වීමට, දන දීමට, විශේෂ වන්දනා ගමනක් යාමට ඇතැම් විට බාර වෙමු. මෙම බාර ඉටු කිරීම දෙවියන් වහන්සේට ගරුබිය පැමකි; ප්‍රේමය දැක්වීමකි.

තව ද ජීවිතයේ විවිධ අවස්ථාවල දෙවියන් වහන්සේට පොරොන්දු දීමට කිතුනුවන් වන අප ව කැඳවනු ලබයි. ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, ආශීර්වාදකාර බන්ධනය හා පූජකවරය යන සක්‍රමේන්තු ලබා ගැනීමේ දී පොරොන්දු දිය යුතු වන්නේ ය.

මෙම බාරහාර හා පොරොන්දු ඉටු කිරීම දෙවියන් වහන්සේට දක්වන ගෞරවයේ හා ප්‍රේමයේ සළකුණකි.

**පළමු පනතට විරුද්ධ ක්‍රියා**

- යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හූනියම් කිරීම
- අංජනම් බැලීම, නැකත් බැලීම
- නැකතට මුල් ගල තැබීම
- රාහු කාලය අනුව ක්‍රියා කිරීම
- විවාහ මංගල්‍යයවල දී පොරොන්දම් බැලීම
- සෙත් ශාන්ති කරවා ගැනීම
- සාස්තර ඇසීම
- වෙනත් දෙවි දේවතාවන්ට බාර වීම

- මූලධර්මවාදීන් පසුපස යාම
- යකුන් හා ආත්ම ගෙන්වා ගනිමින්, බැඳ ගනිමින්, වැඩ ගැනීම
- වෙනත් ආගමික ස්ථානවල දී මල්, පහන්, පළතුරු වට්ටි පිදීම හා ඒවාට අතගැසීම
- ධනය, බලය, කීර්තිය, දේපල, ආභරණ, පසුපස හඹා යාම
- තම හැකියා හා දක්ෂතා මත පමණක් ක්‍රියා කිරීම
- දෙවියන් වහන්සේ මවා ඇති මැවිලිවලට දේවත්වයෙන් පිදීම
- දෙවියන් වහන්සේගෙන් නොලද බලයක් තමාට ඇතැයි සිතා ක්‍රියා කිරීම
- දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම අතපසු කිරීම
- දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු නැති කර ගැනීම
- ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස අර්ථකථනය කිරීම
- දෙවි කෙනෙක් නැතැයි සිතා කටයුතු කිරීම
- විද්‍යාවට අනුව දේවත්වය මිත්‍යාවක් (බොරුවක්) යැයි කීම.

## බලාපොරොත්තුව

දෙවියන් වහන්සේ අනාවරණය කරන කල මනුෂ්‍යයාට තම ස්ව ශක්තියෙන් පමණක් එයට ප්‍රතිචාර දැක්විය නොහැකි ය. එබැවින් දෙවියන් වහන්සේ තමාට ඒ සඳහා සහාය වන බව බලාපොරොත්තු විය යුතු ය.

බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් වන්නේ;

1. ඉච්ඡාභංගත්වය හා
2. අනුමානය යි.

1. ඉච්ඡාභංගත්වය යනු තම ගැලවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යයි බලාපොරොත්තු නොවීම යි. එය දේව යහපත්කමට විරුද්ධ වේ.

2. අනුමානය යනු තමාට ම තම ගැලවීම ලබා ගත හැකි බවත් සිත් හැරීමක් නැති ව ගැලවීම ලබා ගත හැකි බවත් බලාපොරොත්තු වීම ය. එවන් අයගේ විශ්වාසයේ දෙනෙත් විවර කරන ලෙස අපි සැම දෙවියන් වහන්සේට යාච්ඤා කරමු.

බලාපොරොත්තුව නමැති මෙම දේවධර්ම ගුණය අයිති කර ගැනීමට නම් දෛනික ජීවිතයේ දී තමාගේ ශක්තිය පිළිබඳ ව පමණට වඩා සිතා ගැනීමේ පාපයෙන් වරදකරු නොවී දේව කැමැත්ත ම ඉටු කළ යුතු ය. දේව කැමැත්ත මාගේ කැමැත්ත කරගත යුතු ය. දෙවියන් වහන්සේගේ කැමැත්ත මාගේ කැමැත්තට නොගැළපෙන අවස්ථාවල දී සහ ඉටු කිරීමට දුෂ්කර අවස්ථාවල දී පවා එය ඉටු කිරීමෙන් ද මාගේ ජීවිතය මම ඔවුන් වහන්සේගේ හස්තවලට භාර කරමි'යි කියන්නට හැකි නම් අසීමිත ලෙස දේව ප්‍රේමය අත් දකින්නට හැකි වනු ඇත.

## ප්‍රේමය

දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම යනු සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පමණක් මුළු හෘදයෙන් ද මුළු ආත්මයෙන් ද මුළු වීර්යයෙන් ද මුළු බුද්ධියෙන් ද ප්‍රේම කිරීම ය.

දේව ප්‍රේමයට විරුද්ධ පව්

- දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම
- දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම
- දිව්‍යමය වූ යහපතින් කෙනෙකු ව වලක්වාලීම
- උඩඟුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම.

කතෝලික සභා ධර්මෝපදේශය 2094

## දෙවන පනත

"නුඹ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරව. යමෙක් ඒ නාමය අගරු ලෙස භාවිත කරන්නේ ද මම ඔහුට දඬුවම් කරමි"

නික්මයාම 20:7

මෙම පනත පිළිබඳ ව කතෝලික සභාවේ ධර්මෝපදේශයේ සහ ශුද්ධ ලියවිල්ලේ සඳහන් තවත් ඉගැන්වීම් විමසා බලමු.

## දේව නාමය ගෞරවයෙන් භාවිතය

දෙවියන් වහන්සේගේ නාමය ගෞරවයෙන් යුතු ව භාවිත කළ යුතු බව දෙවන පනතින් අපට නියම කරයි. තව ද බොරුවට දිවුරීම තහනම් කරයි. උසාවියක් වැනි ස්ථානයක දී දිවුරුම් දීමට සිදු වූ කල්හි, සත්‍ය පමණක් ප්‍රකාශ කිරීමට අප බැඳී සිටියි.

දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ නාමය අයුතු ලෙස හෝ අගෞරව ලෙස හෝ භාවිත කිරීම දේව අපහාසයකි. ඉතා සුළු කාරණාවල දී හා නිතර නිතර අපගේ කරුණු සනාථ කිරීමට එම නාමයෙන් දිවුරුම් නොදිය යුතු ය. තව ද බොරුවක් සනාථ කිරීමට දෙවියන් වහන්සේගේ නාමය භාවිත කිරීම දේව අපහාසයකි.

කතෝලික සභා ධර්මෝපදේශය 2150-2158



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඔබ මාගේ නාමයෙන් අයැදින කවර දෙයක් වුව ද මම ඉටු කරන්නෙමි.

ජොහන් 14:14

කිතුනුවා දිනය, යාච්ඤාව හා ඔහුගේ සියලු වැඩ රාජකාරි කුරුසේ ලකුණින් ආරම්භ කරයි: "පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ආමෙන්." එම කුරුසේ ලකුණ දුෂ්කර අවස්ථාවල දී පවා අප ශක්තිමත් කරයි.

## කිතුනු නම් භාවිතයේ වැදගත් කම

බව්තිස්ම ස්නාපනයේ දී දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අදාළ පුද්ගලයා ව ශුද්ධවත් කරයි. මන්ද යත්, ප්‍රසාද ස්නාපන නමැති සක්‍රමේන්තුව දානය කරන්නේ පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙනි. එසේ ම ප්‍රසාද ස්නාපනයේ දී පුද්ගලයා ශුද්ධ වූ සභාව තුළ තම නම ලබයි. එය, සාන්තුවර හෝ ආදර්ශවත් ජීවිතයක් ගත කළ කෙනෙකුගේ වීමට දෙමව්පියන්, ආත්මික මව්පියන් හා පූජාප්‍රසාදිවරුන් වග බලා ගත යුතු ය. එම සාන්තුවරයා එම පුද්ගලයාට පරමාදර්ශයක් වන අතර ඒ සාන්තුවරයාගේ යැදුම් එම නම ලැබූ පුද්ගලයාට සහතික කරනු ලබයි.

කතෝලික සභා ධර්මෝපදේශය 2156

දෙවියන් වහන්සේ අප එකිනෙකා නම කියා අමතනු ඇත (යෙසයා 43:1). එබැවින් සැම පුද්ගල නාමයක් ම ශුද්ධවන්ත ය. සැම නාමයකට ම ගරු කළ යුතු ය.

## දෙවන පනතට විරුද්ධ ක්‍රියා

- ලෞකික දේ ඉටුකර ගැනීමේ අදහසින් දෙවියන් නමින් දිව්රීම
- තමා අතින් සිදු වූ පාපයන්, වැරදි දේව කැමැත්ත ලෙස සාධාරණීකරණය කිරීම
- දෙවියන් නමින් හෝ එසේ නොමැති ව හෝ අන් අයට සාප කිරීම, අයහපත පැතීම
- එදිනෙද සිදුවීම්වල දී දෙවියන් වහන්සේට දෙස් කීම
- ශුද්ධ වූ දේ හා දේව වචනය, අගෞරව ලෙස භාවිත කිරීම
- කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම.

මා දෙවි රජිඳුනි, ඔබ ගුණ මම ගයමිඃ ඔබ නම සදකල් ම පසසමිඃ සැමදා ඔබට තුති පුදමිඃ සදකල් ඔබ නම පසසමි.

ගීතාවලිය 145:1-2

## තුන්වන පනත

**ඉරු දිනත් ණය මංගල දිනත් නිවාඩු වලංගු කරව.**

සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න ..........................................


නික්මයාම 20:8-11

දෙව්මැදුර තුළ ඉරුදින දිව්‍ය යාගය සඳහා අපි එකට රැස් වෙමු. දිව්‍ය යාගය තුළ දී මීසම් සංඝයට ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ අභිරහස් උගන්වනු ලබන අතර යහපත් කල්ක්‍රියාව හා සහෝදරත්වය තුළ දයාවේ හා ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමට ඇරයුම් කරනු ලබයි.

ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා අප විසින් සිදු කළ යුතු පළමු ණය යුතුකම වන්නේ දිව්‍ය පූජාවට සහභාගි වීම ය.



16.3 - රූපය දිව්‍ය පූජා යාගය




- දිව්‍ය පූජාව කල්වාරි යාගය සිහිපත් කිරීමකි
- දිව්‍ය භෝජනයේ පිළිවෙත පැවැත්වීමකි

ඉරුදින ශුද්ධවත් ව ගත කිරීම සඳහා;

- සම්පූර්ණ දිව්‍ය පූජාවට හරියාකාර ව සූදානමකින් යුතු ව භක්තියෙන් සහභාගි වෙමු
- වෙනත් දිනවලට වඩා යාච්ඤා කරමු
- රෝගීන් බලන්නට යමු
- දෙමාපියන්ට හා අන් අයට වෙනදට වඩා සහාය වෙමු
- ශුද්ධ ලියවිල්ල කියවමු
- විවිධ සමිති සමාගම්වලට සහභාගි වෙමු
- විවේකයෙන් ගත කරමු

## දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු

- දෙවියන් වහන්සේට නමස්කාර කිරීම
- දෙවියන් වහන්සේට තුති පිදීම
- පාපයට වන්දි ගෙවීම
- ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.

## තෙවන පනතට විරුද්ධ ක්‍රියා

- සිතා මතා ඉරුදින හා ණය මංගල දින දිව්‍ය පූජාවට සහභාගි නොවීම
- දිව්‍ය පූජාවට ක්‍රියාකාරී ව සහභාගි නොවීම
- දිව්‍ය පූජාව වේලාවේ අනවශ්‍ය කථාවේ යෙදීම, පුවත්පත් බැලීම, උසුළු විසුළු කිරීම අන් අයට බාධාවන අයුරින් හැසිරීම
- ඉරුදින හා ණය මංගල දිනවල දී දිව්‍ය පූජාවට සහභාගි නොවී විනෝද ගමන් උත්සව සාද සඳහා සහභාගි වීම
- වස්තු තණ්හාවෙන් ව්‍යාපාර කටයුතුවල හා අතිකාල සේවයේ යෙදීම
- දිව්‍ය පූජාවට ප්‍රමාද වී පැමිණීම හා අවසන් වීමට පෙර පිට වී යාම
- ඉරුදින අන් අයට උපකාර කිරීමට තිබූ අවස්ථා පැහැර හැරීම
- එක්වරුශිලය හා ගොඩමස් කෑමෙන් වැළකීම පිළිබඳ  වූ සභා ශික්ෂාපද කඩ කිරීම

- ඉරුදින දිව්‍ය පූජාව හා දහම් පාසල අතපසුකර අමතර පන්තිවලට සහභාගි වීම
- නුසුදුසු ඇඳුම්-පැළඳුමෙන් දිව්‍ය පූජාවට සහභාගි වීම.

## ක්‍රියාකාරකම

1. ලූක් 10:27 පාඨය දෙවරක් හොඳින් කියවා මෙනෙහි කරන්න. ඒ අනුව ඔබට අයිති වූ දේව පණිවිඩය ලියා දක්වන්න.
2. අන් අයට නම් සෑදීම කොතරම් දුරට කිතුනුකමට නොගැළපෙන ක්‍රියාවක්දැයි කෙටියෙන් විස්තර කරන්න.
3. දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වන ආකාර **දහයක්** ලියන්න.
4. ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වූ ණය මංගල්‍යයන් අට, දිනයන් හා අදාළ මංගල්‍යයන් සමග පෙළ ගස්වන්න.



*ජීවිතය සඳහා*

- *අන් සැමට ම වඩා දෙවියන් වහන්සේට ප්‍රමුඛස්ථානය දෙමි*
- *අන් අයට නම් පට නොබඳිමි*
- *හැම ඉරුදිනක ම දිව්‍ය පූජාවට සහභාගි වෙමි*